28.03.2016

ද මැසිනොද් විදුහල

කතෝලික ධර්මය 10

පළමු වාර පරීක්ෂණය - 2016

I වන ප්‍රශ්න පත්‍රය - කාලය පැය 01 යි.

Learning Resource Centre
De Mazenod College
Kandana

උපදෙස් -

- ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නයට අදාළ නිවැරදි වරණය තෝරන්න.

01. දේව වචනය (අනාවරණයේ ) ප්‍රධාන මූලාශ්‍ර මොනවාද?
    i. ශු. බයිබලය / වාචික සම්ප්‍රදාය
    ii. ශු. බයිබලය / ජීවන සහා සම්ප්‍රදාය
    iii. ජීවන සහා සම්ප්‍රදාය / වාචික සම්ප්‍රදාය
    iv. යාහ්වේ සම්ප්‍රදාය / පූජක සම්ප්‍රධාය

02. පුරාණ ගිවිසුමෙහි පොත් 46 බෙදෙන ප්‍රධාන පොත් කාණ්ඩ .............. කි.
    i. 06 ii. 04 iii. 05 iv. 07

03. පුරාණ ගිවිසුමේ එළිදරව් සාහිත්‍යයට අයත් ග්‍රන්ථය නම්,
    i. ලෙවී ව්‍යවස්ථාව
    ii. සාමුවෙල්
    iii. ආමෝස්
    iv. දානියෙල්

04. මුළු ශු. බයිබලයම ලේඛන ගතවී ඇතැයි පිළිගනු ලබන කාල සීමාව වන්නේ,
    i. ක්‍රි.පූ. 100 - ක්‍රි. ව. 950
    ii. ක්‍රි.පූ. 950 - ක්‍රි.පූ. 100
    iii. ක්‍රි.පූ. 950 - ක්‍රි. ව. 100
    iv. ක්‍රි.පූ. 900 - ක්‍රි. ව. 100

05. ප්‍රඥා සාහිත්‍යයට අයත් පොතක් නොවන්නේ මින් කුමන ග්‍රන්ථයද ?
    i. ගීතාවලිය ii. බාරුක් iii. ප්‍රේම ගී iv. සිරාක්

06. පුද්ගලයින්ගේ හෝ ජනතාවගේ ගැටළු හා ඒවාට විසඳුම් දේව වේදිය දෘෂ්ඨි කෝණයකින් ඉදිරිපත් කරන්නේ මින් කුමන ග්‍රන්ථ කාන්ඩයේද?
    i. එස්රා හා නෙහෙමියා
    ii. ජෝෂුවා සිට 2 රාජාවලිය
    iii. රූත් හා එස්තර්
    iv. රූත් හා එස්රා

07. නව ගිවිසුමේ ප්‍රධාන පොත් කාණ්ඩ ............... කි. (මෙහි හිස් තැනට අදාළ වන්නේ )
    i. 05 ii. 07 iii. 03 iv. 04

08. ශු. ලූක් සුභාරංචියේ දෙවන කාණ්ඩය ලෙස (දෙවන කොටස ) සලකනු ලබන්නේ,
    i. ගලාති පොත ii. රෝම පොත iii. ක්‍රියා පොත iv. 2 කොරෙන්ති පොත

09. "තියෝපිලස්" යන්නෙහි අර්ථය කුමක්ද?
    i. දෙවියන් වහන්සේ පසුපස යන්නා
    ii. දෙවියන් වහන්සේගේ මිත්‍රයා
    iii. ක්‍රිස්තුන් වහන්සේ පසු පස යන්නා
    iv. ක්‍රිස්තුන් වහන්සේගේ මිත්‍රයා

10. අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා වූවා යැයි සැලකෙන්නේ,
    i. ග්‍රීසියේ "ඇතැන්ස්"
    ii. ග්‍රීසියේ "අක්කායා"
    iii. සුළු ආසියාවේ
    iv. සිසිලියාවේ

11. නව ගිවිසුමෙහි සංදේශ ප්‍රධාන කොටස් ............... කට වෙන්කර දැක්විය හැක. ( මෙහි හිස්තැනට අදාළ වන්නේ )
    i. 03 ii. 02 iii. 05 iv. 04

12. ශු. පාවුළු තුමාගේ ලිපි අතරින් ආරුඪ කතෘත්වයට අයත් ලිපි පමණක් අනතර්ගත කාණ්ඩය වන්නේ,
    i. 2 තෙසලෝනික / 1 තිමති / 2 තිමති / එපීස
    ii. 2 තිමති / 1 තිමති / 2 තෙසලෝනික /1 තෙසලෝනික
    iii. 2 තෙසලෝනික /1 තිමති / 2 තිමති / තීතස්
    iv. තීතස් / 1 තිමති / 2 තිමති / 1 තෙසලෝනික

13. "කුරුසියේ සලකුණින්" සංකේතවත් කරන්නේ,

i. ගැලවීම් දායක ප්‍රේමයේ සලකුණ  ii. පාපය විනාශ කිරීමේ සලකුණ
iii. ප්‍රේමයේ අපරාජිත සලකුණ  iv. නව ගිවිසුමේ ගිවිසුම් සලකුණ

14. එළිදරව් සාහිත්‍යයේ ප්‍රධාන ලක්ෂණ .......................ක් දැකගත හැකිය. (මෙහි හිස්තැනට වඩාත් ගැලපෙන්නේ)

i. 05  ii. 04  iii. 03  iv. 02

15. රතු වර්ණය තුලින් එළිදරව් සාහිත්‍යයේ සංකේතවත් කරන්නේ,

i. ජයග්‍රහණය  ii. සාගතය  iii. මරණය  iv. යුද්ධය ලේ වැගිරීම

16. දානියෙල්ගේ ග්‍රන්ථය ලියූ කාලවකවානුව වන්නේ,

i. ක්‍රි.ව. 167 - ක්‍රි. ව. 164  ii. ක්‍රි.පූ. 80 - ක්‍රි.පූ. 96
iii. ක්‍රි.පූ. 167 - ක්‍රි. ව. 164  iv. ක්‍රි.ව. 80 - ක්‍රි. ව. 96

17. "නුඹට සමාන කෙනෙකු නුඹට පළමුවෙන් සිටියේවත් නුඹට පසුව සිටින්නේවත් නැතිවන ලෙස තියුණු නැණ නුවණක් නුඹට දෙමි" මෙම පාඨය හා සම්බන්ධ පුද්ගලයා නම්,

i. දාවිත්  ii. සලමොන්  iii. දානියෙල්  iv. පාවුළු

18. ජීවිත හරය එහි ගැටළු, විනිශ්චය ආදී සංකල්ප පිලිබඳ විග්‍රහ කරන්නේ,

i. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව  ii. රාජ්‍ය සභා ප්‍රඥාව
iii. අභිධාර්මික ප්‍රඥාව  iv. එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව

19. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථයන් අඩංගු නොවන කාණ්ඩය වන්නේ,

i. ප්‍රේම ගී / ගීතාවලිය  ii. ජෝබ් / ගීතාවලිය
iii. හිතෝපදේශ / ධර්ම දේශකයා  iv. ජෝබ් / දානියෙල්

20. පාස්කු අභිරහස ලෙස අප සමරනු ලබන්නේ, ක්‍රිස්තුස් වහන්සේගේ

i. ඉපදීම / දුක්විදීම / මරණය  ii. ඉපදීම / මරණය / දුක්විදීම
iii. දුක්විදීම / මරණය / ස්වර්ගාරෝහණය  iv. දුක්විදීම / මරණය / උත්ථානය

21. ශු. සභාව දේව දයාවේ වසර ප්‍රකාශ කර ආරම්භ කරන ලද්දේ,

i. ජනවාරි  ii. ජෝබ් / ගීතාවලිය  iii. හිතෝපදේශ / ධර්ම දේශකයා  iv. ජෝබ් / දානියෙල්

22. "හොක්මා" යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය වන්නේ,

i. එළිදරව්ව  ii. අනාවරණය වීම
iii. ප්‍රඥාවන්තව ජීවත් වීම  iv. සාර්ථක හා ධර්මිෂ්ඨ ජීවිතය

23. ජොහාන් සුභාරංචියට අනුව ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ ප්‍රථම සාක්ෂිකාරිය වූයේ,

i. ජුවාම් තුමා  ii. පේදුරු තුමා
iii. මග්දලා හි මරියා  iv. මරිය තුමිය

24. "මම අල්ෆා සහ ඔමේගා ය " මෙහි අර්ථය වන්නේ,

i. මම පළමු වැන්නා හා අන්තිමයාය  ii. මම සියල්ලේ ආරම්භකයා හා අන්තිමයාය
iii. මම සියල්ලේ ආරම්භයද අවසානයද වේ  iv. මම මාර්ගයද සත්‍යද ජීවනයද වේ

25. "මාගේ ස්වාමිනි මාගේ දෙවියනි" යැයි හඬ නගමින් තම විශ්වාසය ප්‍රකාශ කලේ,

i. පේදුරු තුමා  ii. ජුවාම් තුමා  iii. තෝමස් තුමා  iv. ජාකොබ් තුමා

26. එම්මාවුස් බලා ගමන් කල ගෝලයින් ක්‍රිස්තුන් වහන්සේව හඳුනා ගත්තේ කුමන අවස්ථාවේදීද?

i. ශුද්ධ ලියවිල්ල පැහැදිළි කිරීමේදී  ii. රොටී ආශිර්වාද කර බෙදා දුන් විට
iii. ඔවුන් අතරින් අත්රුදන් වූ මොහොතේ  iv. ඔවුන්ගේ නම් සඳහන් කල මොහොතේ

27. ශුද්ධවූ ජොහාන් සුභාරංචිය අනුව ශ්‍රාවකයින් හට ශුද්ධාත්ම වරම් ලබාදෙන ලද්දේ,

i. පෙන්තකොස්ත දින  ii. පාස්කු ඉරුදින
iii. 50 වන දින  iv. 40 වන දින

28. ක්‍රිස්තුන් වහන්සේගේ මෘත ශරීරය භූමදාන කිරීම සඳහා පිලාත් ගෙන් අවසර ඉල්ලා ගන්නා ලද්දේ,
i. අරමාතියේ නිකදේමුස් ii. අරමාතියේ අල්පෙවුස්
iii. අරමාතියේ ජෝසප් iv. අරමාතියේ සීමොන්

29. ක්‍රිස්තුන් වහන්සේ වෙනුවට පිලාත් විසින් නිදහස් කරන ලද්දේ,
i. සීලස් ii. සීමොන් iii. හෙරෝද් iv. බර්බ්බාස්

30. ක්‍රිස්තුන් වහන්සේගේ බරවූ කුරුසිය උසුලාගෙන යාමට උන්වහන්සේට සහය වූයේ,
i. සිරේනියේ සීමොන් ii. අරමතියේ සීමොන්
iii. සිරෙනියේ නිකදේමුස් iv. අරමතියේ නිකදේමුස්

31. වර්තමාන සුදතුම් පියාණන්ගේ නිළ නාමය වන්නේ,
i. දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා
ii. විසි දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා
iii. පළවන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
iv. දෙවන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

32. ආධි පිතෘ වරුන්ගේ නම් සඳහන් කාණ්ඩය වන්නේ,
i. ආබ්‍රහම් /ඊසක් /මෝසෙස් ii. ආබ්‍රහම් /මෝසෙස් /ඊසාක්
iii. ආබ්‍රහම් /ඊසක් / ජුවාම් iv. ආබ්‍රහම් /ඊසක් /ජාකොබ්

33. දේව පනත් බෙදෙන ප්‍රධාන කොටස් 2 වන්නේ,
i. දෙවියන් වහන්සේ වනුවෙන් / සමාජය වෙනුවෙන්
ii. දෙවියන් වහන්සේ වනුවෙන් / අසල්වැසිය වෙනුවෙන්
iii. දෙවියන් වහන්සේ වනුවෙන් / හිතවතුන් වෙනුවෙන්
iv. දෙවියන් වහන්සේ වනුවෙන් / ප්‍රේම කරන්නන් වෙනුවෙන්

34. "ආබ්‍රහම්" යන්නෙහි අර්ථය වන්නේ,
i. යහපත් පියා ii. විශ්වාසයේ පියා
iii. ජාතීන්ගේ පියා iv. ඊශ්‍රායලයේ පියා

35. ප්‍රධාන දිවැසිවරු (ලේඛක දිවැසිවරු) ලෙස සැලකෙන්නේ,
i. යෙසායා /ජෙරමියා /හොසියා ii. යෙසායා/හොසියා /එසකියෙල්
iii. යෙසායා /එසකියෙල් /ආමෝස් iv. යෙසාය /ජෙරමියා / එසකියෙල්

36. ශ්‍රී ලාංකික කතෝලික සභාවේ වර්තමානයේ දැකගත හැකි පදවි සංඛ්‍යාව වන්නේ,
i. 11 ii. 12 iii. 13 iv. 15

37. ශ්‍රී ලංකාවේ අපෝස්තුළු වරයා යන විරුදාවලියෙන් පිදුම් ලත් පියතුමා වන්නේ,
i. ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා ii. ජුසේවාස් පියතුමා
iii. මර්සලින් ජයකොඩි පියාතුමා iv. ජෝසප් වෙන්සස් පියතුමා

38. ජුසේවාස් පිතුමන්ව භාග්‍යා වරයට ඔසවන ලද්දේ,
i. 1996 ජනවාරි 21 දෙවන ජුවාම් පාවුළු මුනිතුමන්
ii. 1995 ජනවාරි 21 දෙවන ජුවාම් පාවුළු මුනිතුමන්
iii. 2014 ජනවාරි 05 පළවන ෆැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
iv. 2015 ජනවාරි 05 පළවන ෆැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

39. ශ්‍රී ලංකාවේ වර්තමාන අගරදගුරු පදවිය වන්නේ,
i. කොළඹ ii. මහනුවර iii. අනුරාධපුරය iv. යාපනය

40. මුල් කිතුනු සභාවේ උපස්ථායක තනතුර දැරූ පුද්ගලයෙක් නොවනේ,
i. පිලිප් ii. සීලස් iii. තීමොන් iv. නිකනෝර්

ද මැසිනොද් විදුහල

කතෝලික ධර්මය 10

පළමු වාර පරීක්ෂණය - 2016

**II වන ප්‍රශ්න පත්‍රය - කාලය පැය 02 යි.**

28.03.2016

Learning Resource Center
R
De Mazenod College
Kandana

උපදෙස් -

- ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.
- ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 05කි.

01. i. පුරාණ ගිවිසුමේ දිවැසිවර ග්‍රන්ථ 02ක් ලියන්න.

ii. නව ගිවිසුමේ ප්‍රධාන පොත් කාණ්ඩ මොනවාද?

iii. අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි කතෘ කවුරුන්ද ?

iv. ආරූඪ කතෘත්වය යන්න පැහැදිළි කරන්න.

v. ශු. පාවුළු තුමා විසින්ම රචිත සංදේශ 02ක් ලියන්න.

vi. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ 02ක් ලියා දක්වන්න.

vii. එළිදරව් සාහිත්‍යයේ එන වර්ණ සංකේත 02ක් හා ඒවායේ අර්ථය ලියා දක්වන්න.

viii. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද 02ක් ලියන්න.

ix.) ක්‍රිස්තුන් වහන්සේ කුරුසපත් කල අවස්ථාවේ ඉහලින් තබා තිබූ පුවරුවේ සඳහන් කර තිබුනේ කුමක්ද? (INRI ) - මෙහි අර්ථය

x.) ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප මොනවාද?

02. i. පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් මොනවාද? එහි කතෘ ලෙස සැලකෙන්නේ කවුරුන්ද?

ii. පංච පුස්තකයට අයත් පොත් මොනවද?

iii. ශු.බයිබලයේ කතෘත්වය පැහැදිළි කරන්න.

03. i. අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොත හා ලූක් ශු ආරංචිය එකම පුද්ගලයෙකු විසින් රචනා කරන්නට ඇතැයි පිළිගැනීමට ඇති සාක්ෂි මොනවාද?

ii. අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි සැකැස්ම පැහැදිළි කරන්න.

iii. මුල් කිතුණු සභාවේ ආදර්ශය ගනිමින් ඔබ ලෝකය තුල ක්‍රියාත්මක වන ආකාරය කරුණු 05කින් විස්තර කරන්න.

04. i. ශුද්ධවූ පාවුළුතුමා හසුන් ලිවීමේ පරමාර්ථයන් මොනවද?

ii. ශුද්ධවූ පාවුළුතුමන්ගේ ලිපි වර්ගීකරණය කරන ප්‍රධාන කොටස් මොනවද?

iii. ද්විතීය පාවුළු සංදේශ යන්න පැහැදිළි කර එම කාණ්ඩයට අයත් සංදේශ මොනවාදැයි ලියා දක්වන්න.

05. i. ශුද්ධවූ බයිබලයේ එළිදරව් සාහිත්‍යයට අයත් ග්‍රන්ථ මොනවද ?

ii. එළිදරව් සාහිත්‍යයේ එන සංකේත වර්ග මොනවද? ඒවාට උදාහරණය බැගින් ඉදිරිපත් කරන්න.

iii. දානියෙල් ග්‍රන්ථය බිහිවීමට බලපෑ පරිසරය පැහැදිලි කරන්න.

06. i. පාස්කු අභිරහස යනු කුමක්ද?

ii. ක්‍රිස්තුන් වහන්සේව කුරුසපත් කිරීමට නායක පූජකයින් හා පරිසිවරු උන්වහන්සේට විරුද්ධව නැගූ චෝදනා මොනවද?

iii. පාස්කු අභිරහස තුල අප අත්පත් කර ගත් සදාකාලික ගැලවීම පැහැදිළි කරන්න. (පිළිතුර අවම වශයෙන් ජේලි 05 කින් වත් විස්තර කරන්න.)

07. මාතෘකා 02ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න. (පිළිතුරු ලිවීමේදී එක් මාතෘකාවක් පිළිබඳ ජේළි 08 කින්වත් යුතු විස්තරයක් ගොනු කරන්න.)

i. ශුද්ධවූ සභාවේ දෘෂ්‍ය මාන එඬේරාණන්

ii. ශ්‍රී ලංකාවේ අපොස්තුළුවරයාණෝ

iii. පාස්කු අභිරහස

iv. දේව දයාවේ වසර